

SINHALA LANGUAGE

# 5 tips for fiverr

by Dumidu Neeshan

Fiverr කියන්නේ online marketplace එකක්, ලෝකේ වටේ ඉන්න freelance කරන හැමෝමයි buyers ලා එකතු වෙලා හැදුන online marketing community එකක්. තමන්ට හොදටම පුළුවන් දෙයක් list කරලා service එක දීල මුදලක් හොයාගන්න මේ platform එකෙන් පුළුවන්. එක හොදටම කරන්න පුළුවන් නං වෙන jobs මොකුත් නොකර Fiverr එකෙන්ම හොද ආදායමක් ගන්න පුළුවන්. එහෙම කට්ටිය ලෝකේ හැම තැනකම ඉන්නවා, ලංකාවෙත් සැලකියයුතු පිරිසක් ඉන්නවා, දැන් මම මේ කියන්න යන්නේ තමන්ගේ talent එක ගැන විශ්වාසයක් තියෙන කට්ටියට සහ තමන්ගේ අතට ගානක් හොයාගන්න ඕනෙකම තියෙන හමොටම වැදගත් වෙන Fiverr career එකට ඕනෙම දේවල් කිහිපයක් ගැන කියන්න, මේ කියන එක දෙයක්වත් නැතිව Fiverr එකෙන් ගොඩ යන්න මේ ආත්මෙට බෑ. හැබෑට මොනවද ඒ?

## 1. නිවැරදි අරමුණක්

නිවැරදි අරමුණක් ඇතුව පටන්ගන්න ඕනේ දෙයක පැවැත්මක් තියෙනව, එනිසා ටිකක් කල්පනා කරලා බලන්න ඔයාගේ අරමුණ මොකද්ද කියල, අනික් කට්ටිය කරනවට කරනවද, තමන්ගේ ජීවිතයට වැදගත් දෙයක් එකතු කරගන්නවද කියල.

## 2. fiverr.com account එකක්

කොයි අල ගෙඩිය කරන්නත් Fiverr එකේ account එකක් හදල තියෙන්න ඕනේ, account එකක් නැත්තන් මෙන්න මේකෙන් ගිහින් account හදාගන්න. මුණ

හොදට පේන profile photo එකක් දාන්න, ලෝගෝ එකක් දාන්නත් පුළුවන් එත් ඉන්ටෙර්නෙට් එකෙන් උස්සපු ලෝගෝ එහෙම දාන්න බෑ, දාන කොයි image එකත් original වෙන්න ඕනේ, එතකොට හරි.

**3. Fiverr gigs/gig ideas කිහිපයක්**

Account එකක් හදාගත්තට පස්සේ, තමන්ට හොදටම කරන්න පුළුවන් දේ හෝ දේවල් කිහිපයක් තියෙනවා නං හොදට කල්පනා කරලා ලිස්ට් එකක අරගෙන පිළිවෙලට හදාගන්න ඕනේ, හොදම දේ Fiverr site එකේ හොදට search කරලා බලන එක, එහෙම බලද්දී ඔයාට Fiverr gig එකේ දාන්න ඕනේ content එක gig title එක ගැන idea එකක් ගන්න පුළුවන්.

fiver එකේ ප්‍රධාන කොටස් 8 කට services ටික බෙදල තියෙනව

- Graphics & Design
- Digital Marketing
- Writing & Translation
- Video & Animation
- Music & Audio
- Programming & Tech
- Business
- Lifestyle

මේ sections 8ම හොදට බලල තමන්ගේ හැකියාවට ගැලපෙන හොදම area එක තෝරාගෙන, list කරන්න යන gig එක plan කරන්න තමයි තියෙන්නේ.

**4. Gig image(s) / video / portfolio document (.pdf )**

Plan කරපු gig එක Fiverr එකේ list කරද්දී අපෙන් ඉල්ලනවා images ටිකක්, gig images කියල තමයි කියන්නේ, අපි දෙන්න යන service එකට ඒ images අදාළ වෙන්න ඕනේ සහ එකේ කියල තියෙන resolution(550x370px) එකෙන් හදල දාන්න ඕනේ. images වලට අමතරව අපිට අපේ service එක පැහැදිලි කරලා පොඩි video clip එකක් හදල දන්නා පුළුවන්, images වලට වැඩිය videos වලට තියෙන buyer response rate එක වැඩි කියල තමයි කියන්නේ ප්‍රතිශතයක් අරන් කිව්වොත් **220%**

video එක හරි images ටික හරි දාල, තමන් කරපු පරණ වැඩ ටිකක් එකතු කරලා **PDF** document එකක් හදල අපි දාන්න යන gig එකටම upload කරන්න පුළුවන් පහසුකම දීල තියෙනව. හොදට වෙලාව අරන් ලස්සන document එකක් හදල upload කරන්න තමයි තියෙන්නේ.

**5. Online bank account එකක්**

gig හදල, list කරලා දෙයියනේ කියල වැඩ ටිකක් කරලා ගානක් set කරගෙන මදිනේ, හොයපු ටික අතට ගන්නත් එපැයි. Fiverr එකෙන් support කරන bank 1යි

දැනට තියෙන්නේ, ඒ තමයි payoneer පොඩි කට්ටක් කන්න වෙනවා මේකේ වැඩේ කරද්දී, එක සැරයක් නිසා වැඩිය හිතන්න යන්න ඕනේ නැහැ. මේකෙන් ගිහින් register වෙන්න

මීට අමතරව ඔයාලගේ communication skills හදාගන්න වෙනවා, ඒ කිව්වේ English language skills ටික ටික හදාගන්න වෙනවා, internet එකේ ඕනේ තරං courses හොයාගන්න තියෙනව, තනියම වචනෙන් වචනේ ඉගෙනගන්න, English සින්දු අහන්න, මල් සින්දු අහල English ගොඩදාන්න බැරිබව මතක තියාගන්න. English movies බලන්න, ඕනෙකම තියෙනව නං ගොඩදාගන්න පුළුවන්.

තවත් විස්තර දැනගන්න ඕනේ නං follow කරන්න මාව

Instagram : instagram.com/dumiduneeshan
Facebook : facebook.com/dumiduneeshan

website එක : dumiduneeshan.com
Email කරන්න : ask@dumiduneeshan.com / dumiduneeshan@yahoo.com